# ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික හේන් ගොවිතැන: ඓතිහාසික හා මානවවංශවිද්‍යාත්මක අධ්‍යයනයක්

**ජයනි කුමාරි ෆර්නැන්ඩෝ**

පුරාවිද්‍යා නිළධාරි, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ 07.

**Abstract**

Paddy cultivation, Chena cultivation and home gardening, the traditional agricultural patterns of Sri Lanka, have been continuing from historical times to the present. Chena cultivation is a simple and rotational cultivation technique used by the man in the transition from food gathering to food production economy. Although this method of cultivation is not a state-sponsored formal and sustainable food production system like paddy cultivation, it has been practiced continuously for a very long period to the present day. Thus, there is not enough material evidence to study this ancient technique of cultivation archaeologically. Therefore, the main purpose of this paper is to examine the nature of ancient Chena cultivation based on literary sources, including inscriptions as well as the traditional characteristics of Chena farming through writings based on social anthropological perspective. This research was done using the methods, analyzing of historical texts and secondary sources written through socio-anthropological researches up to the date. In addition, Literary sources and epigraphical evidences were used as primary sources. Although Chena cultivation is a simple technique, it has to face constant decisive environmental factors such as the need for stable water facility and the depletion of futility of the soil due to long term farming. Even though against these difficulties, Chena cultivation provided secondary food and other necessities in the rice-based food culture. The continuation of this farming system prevalent from the Anuradhapura period to the present day is due to the social, cultural and economic stimulations and potentials generated in man by Chena cultivation. Accordingly, this paper is to mainly discuss considering the facts based on Chena

cultivation was secondary food production system among the common people with its own traditional characteristics and the sociological, historical and cultural background related to the manner in which Chena cultivation were used to suit the agro-economic needs of the natural environment as well.

*Key Word*: Paddy cultivation, Chena cultivation, traditional, agricultural.

**හැඳින්වීම**

වර්තමාන භාවිතාව තුළ හේන් ගොවිතැන වශයෙන් හැඳින්වුව ද, ඓතිහාසික අවධියේ දී විවිධාකාර නාමයන්ගෙන් මෙම වගා ශිල්ප ක්‍රමය හඳුන්වා ඇත. පොළොන්නරු අවධියේ දී '**සෙහෙන් කටුසර**' (EZ II, 105) ආදී නාමයන්ගෙන් ද දඹදෙණිය අවධියේදී '**සේන**' ආදී නාමයන්ගෙන් හඳුන්වා ඇත. '**වල්**' හෝ '**වල්පිට**' යන්න ද, '**රත්මාසර**' හෝ 'රත්මහැර' යන්න ද, හේන සඳහා භාවිත තවත් නාමයන් විය (Codrington, 1938, 8). VI වන පරාක්‍රමබාහු අවධියට අයත් (ක්‍රි.ව. 1412-1467) අරමනපොල ලේඛනයේ මෙය පුළුල් ව දක්වා ඇත. එමෙන්ම ශක වර්ෂ 1727 ට අයත් (ක්‍රි.ව. 1805) වැලිවිට සන්නසේ හේන යන්න '**ගොඩ වල්පිට**' යනුවෙන් දක්වා තිබේ. 1808 දී සමන් දේවාලයට අයත් සබරගමුව ලේකම්මිටිය හා අටකලන් කෝරළයට අයත් දිසා ලේකම් මිටියේ ද මේ නාමය දක්නට ලැබේ (එම). '**ගොඩ මඩ**' යන පොදු නාමය (**උස් හා මඩ භූමි**) සන්නස් හා සීට්ටුවල දක්නට ලැබේ. එනම් 1734 ට අයත් බුත්තල වැදිරට කවුඩෑව සීට්ටුවේ **උස් හා මඩ භූමි** යන්න '**ගොඩ හේන් ද මඩ කුඹුරුවලින් ද**' යනුවෙන් දක්වා ඇත. '**රත්මහැර**' හෙවත් '**රත්මාසර**' යනු '**රජුට අයත් මහා වනලැහැබ**' යන්නයි. මෙය සාමාන්‍යයෙන් අත්හරින ලද්දක් විය. එය හේන් වගාව සඳහා භාවිතා කරන ලදී. ක්‍රි.ව. 17 වන සියවස ආරම්භයේදී පමණ මේවා '**පරවේණි**' ලෙස සලකන ලදී (එම).

පොළොන්නරු අවධියේ දී හේන් ගොවිතැනින් අය කරන ලද බද්ද '**කැති අඩ**' (EZ II, 77, 88, 138-139, 285) 'සෙහෙන් කටුසර whZ (EZ II, 105), '**කෙත් අය**' (EZ II, 93) ආදී නම්වලින් හඳුන්වන ලද බව අනුරාධපුර රුවන්මැලි දාගැබ අසල කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල පුවරු ලිපිය, පොළොන්නරුව හැටදාගේ පුවරු ලිපිය, පොළොන්නරුව රන්කොත් දාගැබ පුවරු ලිපිය, කන්තලේ ගල්ආසන ලිපිය ආදී ශිලාලේඛනවලට අනුව පෙනී යයි. හේන් ගොවිතැන සඳහා කැළෑ එළි කිරීමේ දී වැඩියෙන්ම පාවිච්චි වූයේ කැත්ත නිසා හේන් ගොවිතැනින් උපදවන ලද ධාන්‍ය සඳහා අය කරගත් බද්ද '**කැති අඩ**' නමින් හැඳින්වෙන්නට ඇතැයි ද පරණවිතාන උපුටා දක්වමින් ආරියපාල තවදුරටත් කියයි (ආරියපාල, 2014, 117). නිශ්ශංකමල්ල රාජ්‍ය සමයේ හේන් ගොවිතැනෙහි නියැළුණු ගොවීන් හට වඩාත් සහනදායි කාලපරිච්ඡේදයක් වූ බව ඔහුට අයත් ශිලාලේඛන කිහිපයක හේන් ගොවිතැනින් අය කළ ඉහත සඳහන් '**කැති අඩ බද්ද**' හා '**සෙහෙන් කටුසර බද්ද**' අය නොකරන ලද බව සඳහන් වීමෙන් පෙනී යයි (EZ II, 88, 77, 90, 81, 105, 138-139, 285, 288).

ඓතිහාසික අවධියේ සිට අඛණ්ඩව පැවති කෘෂිකාර්මික වගා ක්‍රමයක් වන මෙම වගා ශිල්ප ක්‍රමයේ සාමාන්‍ය ක්‍රමවේදය වන්නේ එක් භූමියක් වසර කිහිපයක් වගා කොට,

පස නිස්සාරණය වීම නිසා සැලකිය යුතු කාල සීමාවක් අත්හැර දැමීම යි. එබැවින් අඛණ්ඩ සංස්කෘතික අනුපිළිවෙලක් මෙම භූ පරිභෝජන රටාව තුළ දැක ගත නොහැක. මෙවැනි කෙටිකාලීන සංස්කෘතික භූ දර්ශනයක් සහිත අවකාශයක් කේවල කාල හා කේවල මාධ්‍ය පදනම මත පුරාවිද්‍යාත්මක පථයක් ලෙස අර්ථ ගැන්විය හැකිය. පුරාවිද්‍යාවේ දී පථයක් යනුවෙන් විග්‍රහ කෙරෙන්නේ කෙටිකාලීන මිනිස් සබඳතා ඇති අවකාශය හැඳින්වීමට යි (සෝමදේව, 2006, 28). එබැවින් මෙවැනි කේවල කාල හා කේවල මාධ්‍ය සහිත පුරාණ සංස්කෘතික අවකාශ වටා පැවති හැසිරීම් පිළිබඳ අධ්‍යයනයට ප්‍රමාණවත් පුරාවිද්‍යාත්මක සාධක හමු නොවන බැවින් ඓතිහාසික මූලාශ්‍රයන් හා මානවවංශ විද්‍යාත්මක පර්යේෂණයන්ට අනුව සාම්ප්‍රදායික හේන් ගොවිතැනෙහි ස්වරූපය පිළිබඳ මෙහිදී සාකච්ඡාවට බඳුන්කර ඇත.

**සාකච්ඡාව**

සාම්ප්‍රදායික හේන් ගොවිතැනෙහි සමස්ත ක්‍රියාවලිය ගත්කල, භූමිය තෝරාගැනීම, එළිපෙහෙළි කිරීම, ගිණි තැබීම, වගා කිරීම, අස්වැන්න ලබාගන්නා තෙක් වගාව ආරක්ෂා කරගැනීම, අස්වැන්න නෙළීම යන කාර්යයන්ගෙන් සමන්විත වේ.

**වගාව සඳහා භූමිය තෝරාගැනීම**

පුරාණයේ දී ගමක වැසියන් තම හේන් එකම යායක් ලෙස සකස් කළේ විශේෂයෙන් වන සතුන්ගෙන් ආරක්ෂා කිරීමේ පහසුව තකා ය. එහිදී කාටත් සාධාරණ ලෙස යායේ හේන් බෙදා ගැනීම සිදු විය. උදාහරණ වශයෙන් අට දෙනෙකු එක්ව හේන් බෙදා ගැනීම සිදු විය. ගැමි සමාජයේ සාමුහිකත්වය ආරක්ෂා වීමට ද මෙම හේන් බෙදා ගැනීමේ ක්‍රමය බෙහෙවින් උපකාරී විය. (කරුණානන්ද, 1995, 67-68).

හේන් වගාව සඳහා සුදුසු විශාල ඉඩම තෝරා ගන්නා ලද්දේ ගොවීන්ගේ සාමුහික සාකච්ඡා මගිනි. එම ඉඩම ගමේ පොදු අයිතියට යටත් විය යුතු ඉඩමකි (සිරිවීර, 2017, 70). හේන් කෙටීමට තෝරාගන්නේ ඝන කැළෑ වන අතර, එහිදී ගම්වැසියන් කණ්ඩායමක් අක්කර දෙකක හෝ තුනක කැළෑ ඉඩමක් හේන් කෙටීම සඳහා තෝරාගනී (විජේසේකර, 1986, 135). හේන් සඳහා කැළෑ ප්‍රදේශයක් තෝරා ගැනීම සඳහා පංගුකාරයෝ එක්රැස් වෙති. සුදුසු කැළෑවක් තෝරාගැනීමෙන් පසුව කැළෑව මැද එක් මිනිසෙකු සිටුවා අන් අය හූ හඬක දුරට යති. මධ්‍ය ලක්ෂ්‍ය (මුල්කැටේ) වශයෙන් ගසක් (මුල්ගස) තෝරාගෙන රියනක හෝ දෙකක වැලක් ගසෙහි ගැටගසා ඉන් ගස වටා චක්‍රයක් ලකුණු කරගනී. එම පරිධිය කුඤ්ඤ ගසා ලකුණුකර හේන් කණු ගසා පංගු වෙන්කර ගනී. නිදසුනක් වශයෙන් සම්පූර්ණ පංගුවට රියනක් ද පංගු භාගයකට අඩ රියනක් ද ලකුණු කෙරේ. මේ අනුව තම තමන්ගේ පංගු වෙන් කර ගන්නා ගොවීහු හේන් කොටා පුළුස්සා වැපිරීම් කරති. මේ අනුව මුළු හේන කරත්ත රෝදයක් වැනි වේ. මායිම් ගරාදි වැන්න (අභයවර්ධන, 2009, 246). තුම්පනේ ඉඩම් නිරවුල් සමීක්ෂණයේ දී පවා මුල්කැට ලකුණුකර හේන් වගා කළ බව කොඩ්රින්ටන් පෙන්වා දෙයි (එම, 248). උතුරුමැද පළාතේ ද මෙසේ වගා කරන ලද බව අයිවර්ස් විසින් ද වාර්තාකර ඇත (තෙන්නකෝන්, 2005, 365). අනුරාධපුර පුල්එළිය ග්‍රාමයේ ද වටහේන් ක්‍රමය නම් වූ මෙම ක්‍රමයට වගා කටයුතු සිදු කරන ලද බව ඊ. ආර්. ලීච් සඳහන් කරයි (ලීච්, 2016, 383-388). මීට අමතරව ආයත චතුරස්‍රාකාරව සකසාගත් මුළු හේන පංගුවලට බෙදාග නිමින් වගා කරන ලද පංගු හේන නමින් වූ තවත් සාම්ප්‍රදායික හේන් බිම් රටාවක්

පැවති බව ද දැක්වේ (එම). වෙල්ලස්ස හා බුත්තල ප්‍රදේශවල හේන් බෙදීම මීට වෙනස් විය. දිසාවගේ කැමැත්ත පරිදි හේන් බෙදා දුණි. දිසාව විසින් ගමරාළ යටතට පත් කරන ලද හේන් ගමරාළ විසින් බෙදා දෙන ලදී (අභයවර්ධන, 2009, 246). **හේන් ආරච්චි** යනු හේන් ආරක්ෂා කරන නිලධාරියා සඳහා යෙදෙන නාමය යි. එම සේවය සඳහා ඔවුන්ට මුරුත්තෙට්ටු හේන් ලැබේ. හේන් ආරච්චි, හේන් මුහන්දිරම් යනාදි නිලධාරිහු හේන් නායකයෝ නම් වෙති. '**හියර හේන්**', '**නවදූලි හේන්**', '**මූකලන් හේන්**' යන හේන් වර්ග ගොවීන් අතර බෙදා දී සංවිධානය කිරීම ද ඔවුන්ට අයත් රාජකාරිය යි (සිංහල ශබ්ද කෝෂය, 1991, 401). මෙහි සඳහන් නවදූලි හේන් නම් වූ හේන් ඓතිහාසික අවධියේ ද ව්‍යවහාරයේ පැවති බව පූජාවලියේ දැක්වෙන 'මහා වන මධ්‍යයෙක නව දූලි සේනක් මවාලා ගින්නෙන් දැ කණුවෙක දා' යනුවෙන් සඳහන් කිරීමෙන් පැහැදිලි වේ (පූජාවලිය, 1986, 316).

කැළෑවේ ඕනෑම ප්‍රදේශයක් හේන් සඳහා තෝරා නොගත් අතර ගොවීහු සිය අත්දැකීමෙන් හා එක් එක් බෝගයන්හි අවශ්‍යතාව අනුව කැළෑ ප්‍රදේශයන් තෝරා ගන්නා ලදී. එනම් හත් කෝරළේ දෙමළ හත්පත්තුවේ හේන් ගොවිතැන නිදසුන් ලෙස දැක්විය හැකිය. කුඩා ගස් කපා පිළියෙල කරගත් හේන්, කුරහන්, මෙනේරි වැනි ධාන්‍යවලට සුදුසු බවත්, විශාල ගස්වලින් යුත් මූකලන් එළිපෙහෙළි කර සාදාගන්නා හේන් මිරිස්, එළවළු වැනි භෝගවලට සුදුසු බවත් ඔවුන්ගේ අදහස් විය (අභයවර්ධන, 2009, 246-247). 'අත්දඬුවා' හේන් අතක් පමණ වූ ගස් ඇති කැළයකි (පීරිස්, 2016, 49). එමෙන් ම තල හේන් කෙටීමට ඉතාමත් යෝග්‍ය වන්නේ ලඳු කැළෑ සහ කටු පඳුරු සහිත මිටි කැළෑ ය. ඒවා කැපූ විට ඉක්මණින්ම වියළි යනු ඇත. වන කැළෑ කපා වියළීමට දිගු කලක් යන බැවින් වන කැළෑ බිම් තල හේන් ගොවිතැනට යෝග්‍ය නොවේ (තෙන්නකෝන්, 2005).

**භූමිය එළිපෙහෙළි කිරීම**

කැළේ එළි කරන්නට පටන් ගන්නේ පායන කාලයේ දී ය. ගස් කපා කැළය එළි කිරීමේ දී විශාල ගස් ස්වල්පයක් සෙවණ පිණිස තිබෙන්ට හරිති (විජේසේකර, 1986, 135). වගාවන් සඳහා කැළෑ එළි කිරීමේ දී තෝරාගත් සමස්ත ප්‍රදේශයේම ගස් නොකපා, ඇතැම් මහ ගස් ශේෂ කිරීමට ගොවියෝ වග බලා ගත්තේ වගා කිරීමේ දී විඩාව සන්සිඳුවා ගැනීම සඳහා සෙවණ සලසා ගැනීමට හා වගාව ආරක්ෂා කිරීමට ගස් පැලක් ආදිය ඉදි කරගැනීමේ දී මෙම මහ ගස්වල උපයෝගීතාව වැඩි වූ නිසා ය. තවත් අයුරින් මෙසේ මහ ගස් නොකපා ඉතිරිකර දැමුවේ මෙම මහ වෘක්ෂ වසර ගණනාවක් තිස්සේ මිතුරෙකු මෙන් පරිසරය සතා සිවුපාවන් ආදිය හා අන්‍යෝන්‍ය ව බැඳී සිටි නිසා ද වන්නට ඇත. එපමණක් නොව වෘක්ෂවලට දෙවි දේවතාවුන් වහන්සේලා අරක්ගෙන ඇති බවට ඔවුන් තුළ පැවති විශ්වාසය නිසා වන්නට ඇත. වැද්දන් ද කුරක්කන් වැවීමේ දී පඳුරු හා තණකොළ ආදිය කපා දමා ගිනි තබනු ලැබේ. ලොකු ගස් එලෙසම තිබෙන්නට හරිති (ජයසේන, 2014, 76). හේන් ගොවිතැන සඳහා මෙම කැළෑ එළිපෙහෙළි කිරීමේ කාර්යය පිළිබඳ මහාවංශය ද සඳහන් කරයි. ගෝඨයිම්බර හා ඔහුගේ සොහොයුරන් කැළෑ එළිපෙහෙළි කොට හේනක් සකස් කර උඳු වැපිරූ බව මහාවංසයේ සඳහන් වේ (මහාවංශය, 2014, පරි.23. පෙළ 51).

එක් එක් වගාවන්ගේ වගා කාලසටහන් වෙනස් වූ අතර එම බෝගයන්ට අදාළ කැළෑ එළිපෙහෙළි කිරීමේ කාලය ද වෙනස් විය. නිදසුන් නම් උතුරුමැද පළාතේ එල්ලු

නොහොත් තල හේන් තනාගැනීමට කැළය කැපීම සිදු කරන්නේ ජනවාරි - පෙබරවාරි සමයේ දී බවත්, වපුරනු ලබන්නේ පෙබරවාරි - මාර්තු කාලය තුළ දී බවත්, කපු හා කුරක්කන් මිශ්‍ර කොට වගා කිරීමේ දී හේන් කෙටීම මැයි මාසයේ දී ආරම්භ කරන බවත් අයිවර්ස් විසින් වාර්තාකර ඇත (තෙන්නකෝන්, 2005, 366-369).

**ගිණි තැබීම**

පඳුරු හා කුඩා ගස් එළිපෙහෙළි කර ඒවා වියළීමට ඉඩ හරී. වියලුනු පසු ගිනි තබන්නේ හුළං හමන දිසාවට ගින්න පැතිරී යන ආකාරයෙනි (සිරිවීර, 2017, 71). වගාව සඳහා ස්ථානයක් සැකසීම හා ගහකොළාදිය එළිපෙහෙළි කිරීම සඳහා හේන් ගොවිතැන්කරුවන් විසින් සිදුකරනු ලබන නියමානුකූල ක්‍රමවේදය ගිණි තැබීම යි. මෙහි දී ආහාර නිෂ්පාදනය වැඩිකර ගැනීමට දායක වන ඵලදායි ප්‍රතිඵල පවතී. එනම්,

- ක්ෂේත්‍රයේ පවතින වල් පැළෑටි හා අනවශ්‍ය ගහකොළාදිය එළිපෙහෙළි කිරීම.
- අහිතකර කෘමීන් හා පැළෑටිවලින් පැතිරෙන රෝග මර්දනය කිරීම
- බෝග පහසුවෙන් සිටුවීමට හැකි වන පරිදි පාංශු ව්‍යුහය වෙනස්වීම.
- පස්වල පවතින පෝෂ්‍ය කොටස් වර්ධනයවීම.
- පාංශු ආම්ලිකතාව අඩුවීම.
- පිළිස්සීම නිසා ශාක කොටස්වලින් යුත් පෝෂණ ගුණයෙන් යුත් අළු සමග පස්වල පවතින සරු බව වර්ධනය වීම.
- පස්වල රෝගකාර බීජාදිය අඩුවීම.
- එළිපෙහෙළි කිරීම් නිසා අනෙකුත් ක්‍රියාවලි සමග සංසන්දනයේ දී මිනිස් ශ්‍රමය අඩුවීම යනාදිය යි (Thrupp et.al, 1997, p. 6).

ඓතිහාසික අවධියේ බෝග වගා කිරීම සඳහා හේන් බිම් සකස් කරගැනීමට ගිනි තැබූ ආකාරය පිළිබඳව පූජාවලියේ දැක්වෙන 'ගිනිගෙන දිළිසෙන හේනක් සේ' යන උපමාවෙන් පැහැදිලි වේ (පූජාවලිය, 1986).

හේන ගිනි තැබීමේ ක්‍රියාවලියට පෙර වනය සිය වාසස්ථානය කරගත් සතුන්ට එය දන්වූයේ ගින්නෙන් සිය දිවි ගළවාගන්නා ලෙස කරන ලද පණිවිඩයක් ලෙසිනි. එළවුම් යාතිකාව සහ කැළෑ එළවුම නමින් ද එම කාරිය හැඳින්විණි. හේන ගිනි තැබීමට පෙර පැවති තුන්වරුවක් හූ යාදින්න කීම නුවරකලාවිය හා තමන්කඩුවේ දැකිය හැකිය. යාය රාල හූ යාදින්න කියනවිට සෙසු ගොවීහු තැටි හඬවති. උදලු තලවලට යකඩයකින් පහර දෙමින් නාද කිරීම ඉන් අදහස් කෙරේ (කහඳගමගේ, 2011, 36, 43). නියං සමයේ දී කැළෑ කපා ගිනි තබා බිම් සකස්කර ගැනීමෙන් පසු ගොවියන්ගේ අපේක්ෂාව වර්ෂාව වේ. දින ගණනාවක් තිස්සේ ගිනි තැබීමෙන් පසු වගාව සඳහා ධාන්‍යාදිය ඉසීමට පෙර පස ප්‍රාණවත් වීම සඳහා ජලය අත්‍යවශ්‍ය සාධකයකි. ගැමියන්ගේ මෙම අව්හිංසක වූ අපේක්ෂාව පූජාවලියේ සඳහන් වන්නේ "මේඝ කාලය ප්‍රාර්ථනා කරන ඇල් ගෙවිලියන් සේ" යනුවෙනි (පූජාවලිය, 1986).

**බෝග වගා කිරීම**

බෝග වගා කිරීමේ දී ඊසානදිග මෝසම් සුළං හා නිරිතදිග මෝසම් සුළං පදනම් කොටගෙන ගොඩනැගුනු යල හා මහ කන්න දෙක ප්‍රධාන වගා කාලයන් දෙකක් විය. **යල කන්නය** යනුවෙන් හඳුන්වා ඇත්තේ නිරිත දිග මෝසම් සමය යි. **මහ කන්නය** යනු ඊසානදිග මෝසම් සමය යි. යල කන්නයේ දී ගොවිතැනට සෑහෙන තරම් වර්ෂාපතනයක් දිවයිනේ නිරිතදිග ප්‍රදේශවලට ලැබුණ ද වියළි කලාපයට එසේ නොලැබිණි. එබැවින් මහ කන්නයේ දී ඊසානදිග මෝසමින් ලැබෙන ජලය වැව්වල රැස්කර ගෙන මැයි, ජුනි, ජූලි ආදී මාසවලට නියං සමයේ දී වගා කටයුතු කෙරිණ. මහ කන්නයේ දී වියළි කලාපයේ බොහෝ කොටස්වලට සැලකිය යුතු වර්ෂාපතනයක් ලැබුණ බැවින් ඉතා විශාල කොටසක වී ගොවිතැන් කෙරිණ. එබැවින් ම එම කාල සීමාව මහ කන්නය යනුවෙන් පුරාණයේ සිට හැඳින්වූ බව පෙනේ. යල කන්නයේ දී වී ගොවිතැන් කරනු ලැබුවේ ජල සම්පාදිත බිම් ප්‍රදේශවල පමණි.

මෙම කන්න පිළිබඳ ශිලාලේඛනයන්හි ද සඳහන් වී ඇත. අනුරාධපුර මුල් භාගයේ ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රදේශවල ගොඩ හා මඩ ඉඩම්වල කන්න තුනක දී වගා කටයුතු සිදු කරන ලද බවට සිරිමේඝවර්ණ රජුගේ තෝනිගල පර්වත ලිපිය කදිම නිදසුනකි. **පිඩදඩහස, මදෙහස හා අකලහස** යනුවෙන් හැඳින්වුණු ශස්‍ය වාර තුනක් ගැන එහි සඳහන් වේ (EZ III, 177-178, 185). **මාස් කන්නය මාහ** යනුවෙන් ද **යල් කන්නය අකලහස** යනුවෙන් ද හැඳින්වුණු අතර මෙම ශස්‍ය වාර දෙක අනුරාධපුර හා පොළොන්නරු යන යුගවලදී **පුබ්බණ්ණ සමය** හා **අපරණ්ණ සමය** යනුවෙන් හඳුන්වා ඇත. අභිධානප්පදීපිකාවට අනුව මාහ යනු අපරණ්ණ කාලය යි (අභිධානප්පදීපිකා, 1883, 291). මාස කන්නයේදී වගා කටයුතු කිරීමට තම සොහොයුරන්ට සහය නොවීම නිසා ගෝඨයිම්බර යෝධයා සමග තම සොහොයුරා උරණ වූ බව සඳහන් වේ (සද්ධර්මාලංකාරය, 1996, 473). ඓතිහාසික අවධියේදී පුබ්බණ්ණ හා අපරණ්ණ යනුවෙන් ධාන්‍ය වැපිරීම පැවති බව සීහලවත්ථුප්පකරණයේ එන කථාවස්තු ඇසුරින් ද අනාවරණය කර ගත හැකිය (ඉතා පැරණි සිංහල බණ කථා, 80, 91, 132). එමෙන්ම මුං, මෑ, තල, කොල්ලු, ලබු, කොමඬු ආදී බෝග අපරණ්ණ බෝග ලෙස ද සමන්තපාසාදිකාවේ දක්වේ (සමන්තපාසාදිකා විනයට්ඨකථා, 2009, 248). සිඛවළඳවිනිසට අනුව ද උඳු, මුං, තල, කොමඬු ආදිය අපරණ්ණ බෝග ලෙස ද, ඇල් වී, වරා, නිරි ආදිය පුබ්බණ්ණ බෝග ලෙස දක්වා ඇත (සිඛවළඳ හා සිඛවළඳ විනිස, 2008, 78). ඇල් වී, මුං, මෑ (ඉතා පැරණි සිංහල බණ කථා, 2002, 16, 22-23,28, 78,85). එමෙන් ම අභිධානප්පදීපිකාවේ මුං, උඳු ආදිය අපරණ්ණ බෝග ලෙස ද, ඇල් වී, අමු, තිරිඟු, වරා, යව, තණ ආදිය පුබ්බණ්ණ බෝග ලෙස ද දක්වා ඇත (අභිධානප්පදීපිකා, 1883, 132).

අනුරාධපුර හා පොළොන්නරු අවධීන්හිදි උඳු, මුං, බෝංචි, තල, උළුහාල් මහා පරිමාණයෙන් වගා කරන ලද **තෝනිගල ශිලා ලිපිය, බදුළු ටැම් ලිපිය, එප්පාවල ලිපි, පොළොන්නරු රාජ සභා මණ්ඩප ශිලා ලිපිය, මැද උල්පොත ටැම් ලිපිය** ආදී ශිලා ලේඛනයන්හි සඳහන් වේ (EZ III, 177-178, 185, 80, 192-194; E.Z. IV, 39, 55; අමරවංශ, 1969, 216, 275-276). මහාවංසයට අනුව උඳු, තල, කොමඬු, උක්, තණහාල්, ඇල් වී, ආදිය මහා පරිමාණයෙන් වගා කරන ලද බව සඳහන් වේ (මහාවංසය, 2014, පරි. 29. පෙළ 12; පරි. 34 පෙළ 56; පරි. 23 පෙළ 51; පරි. 35. පෙළ 7; පරි. 32 පෙළ 29-30; පරි. 34 පෙළ 55-56). දඹදෙණිය, ගම්පළ රාජ්‍ය අවධීන්හි රචිත සාහිත්‍ය ග්‍රන්ථයන්හි

ද හේන් ක්‍රමය තුළ බහුලව වගා කෙරුණු බෝග පිළිබඳව සඳහන් වේ. ලබු, මුරුංගා, වම්බටු (පූජාවලිය, 1986), සිහින් මෑ, මහ මෑ, මුං, තියඹරා, කැකිරි, කොමඩු, උක්, ලබු, (බුත්සරණ, 2002, 48-50), මෑ (රසවාහිනිය, 1987, 132), ඇල් වී, මහ මෑ, කළු මෑ, උඳු, මුං ආදී ධාන්‍ය (සද්ධර්මාලංකාරය, 1996, 595) නිදසුන් ලෙස දැක්විය හැකිය. එමෙන්ම උඳු, මුං, තල, කොල්ලු, මෙනේරි ආදී ධාන්‍යාදිය වගා කළ හේන්වලින් සශ්‍රීක වූ පරිසරයන් ගැන කෝට්ටේ අවධියේ සන්දේශ සාහිත්‍යය ද විස්තර කර ඇත (ගිරා සන්දේශය, 1991, 123 වන පද්‍යය).

ක්‍රි.ව. 17 වන සියවසේ දී මෙරට කුරක්කන්, තණ හාල්, මුං, අමු, මෙනේරි, තල ආදී ධාන්‍ය වගා කරන ලද බව රොබට් නොක්ස් සිය වාර්තාවේ සඳහන් කර ඇත (කරුණාරත්න, 2000, 70).

ක්‍රි.ව. 19 වන සියවස පමණ වනවිට දී සාම්ප්‍රදායික හේන් ගොවිතැනේ දී වගා කරන ලද ප්‍රධාන භෝග අතර කුරක්කන්, බඩඉරිඟු, තල, වරගු ආදිය වූ බව පෙනේ. ඕට්ස්, බාර්ලි හා තිරිඟු යන භෝග මධ්‍යම කඳුකර ප්‍රදේශයට හඳුන්වා දෙන ලද්දේ ක්‍රි.ව. 18 හා 19 වන සියවස්වල දී වෙනස් වූ අධිකාරි ද්විත්වයක් මගින් බවට පැහැදිලි ඓතිහාසික වාර්තා පවතින බවට ඇතැමුන් දක්වයි (Manathunga, 2006). එය මුල්වරට හඳුන්වා දෙන ලද්දේ උඩරට රජවරුන් විසින් ස්ථානීය අවශ්‍යතා වෙනුවෙන් ය. පසුව බ්‍රිතාන්‍ය වගාකරුවන් විසිනි. විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයින් හෝර්ටන්තැන්න පිහිටා ඇති නුවරඑළිය දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාව තුළ මෙම අත්හදා බැලීමේ වගා කර්මාන්තය උදෙසා සුදුසුම ප්‍රදේශය ලෙස තෝරාගන්නා ලදී. එයට ප්‍රධාන හේතුව වූයේ මෙම ධාන්‍යවලට පමණක් නොව බ්‍රිතානයයින්ගේ වාසයට පවා සුදුසු වූ දේශගුණයකින් යුක්ත වීමයි (එම). ක්‍රි.ව. 19 වන සියවසේ මැද භාගයේ හා ඉන්පසුව සේවය කළ උද්භිද විද්‍යාඥයින් මෙම ධාන්‍ය ප්‍රභේද පිළිබඳ ඉහළ කඳුකර ප්‍රදේශවල දක තිබේ. එමෙන්ම එම ධාන්‍ය ප්‍රභේද කාලයෙන් කාලයට මෙම ප්‍රදේශයේ කුඩා පරිමාණයෙන් වවන ලද බව ඔවුන් විසින් සඳහන් කර ඇත. කෙසේවෙතත් මෙම විදේශීය ධාන්‍ය වගාවන් ශ්‍රී ලංකාවේ ගොවීන් අතර එතරම් ජනප්‍රිය නොවුණු අතර ඔවුන් ඒවා පසුව අත්හරින ලදී (එම).

බ්‍රිතාන්‍යයින් උඩරට ඈඳා ගන්නා කාලයේ දී වුව ද නුවරකලාවියේ වාරිමාර්ග අබලන්ව තිබීම නිසා ගැමි ආර්ථිකය හුදෙක් යැපීම් මට්ටමේ එකක් විය. වී නිෂ්පාදනය අඩු වූ හෙයින් එම අඩුව පිරිමසා ගත්තේ හේන්වල කුරක්කන් ප්‍රධාන ධාන්‍ය වගා කිරීමෙනි (කරුණානන්ද, 2015, 21). සිංහලෙන් හේන් යැයි හඳුන්වනු ලබන කැළේ තාවකාලික ව එළිකළ තැන්වල වැද්දන් විසින් ද කුරක්කන් වවනු ලැබූ බවත්, එමෙන්ම රතු මිරිස් හා ලබු වර්ග ද ඇතැම්විට බඩ ඉරිඟු ද මුං ද වවනු ලැබේ හෙන්රි පාකර් සඳහන් කරයි (ජයසේන, 2014, 76). වන්නියේ වවන ලද වියළි ධාන්‍ය වූයේ කුරක්කන්, වරගු හා තල යි (Bastiampillai, 1991, 117). වරගු වියළි ධාන්‍යය බෙහෙවින්ම වවන ලද්දේ පුදුකුඩිඉරුප්පු ග්‍රාමයේ ය. එය ප්‍රධාන වශයෙන් හා ජනප්‍රිය වශයෙන් පරිභෝජනය කරන ලද ප්‍රදේශය යි. එල්ලු හෝ තලවලට ඉතා හොඳ ඉල්ලුමක් විය. ඊට හේතුව එම ධාන්‍යය අඹරා කෑමට සුදුසු පරිදි හා වෙනත් අරමුණු සඳහා භාවිතා කළ මිල අධික වටිනා තෙල් ලබාගත හැකි බැවිනි. සමහර හේන්වල ප්‍රධාන වශයෙන් ඒවා පිරිසිඳු විය (එම)ග නුවරකලාවියේ කෑමට ගන්නා අනෙක් ධාන්‍ය වර්ග ද එළවළු වර්ග ද කපු හා හණ වර්ග ද හේන්වල වගා කරන ලදී. වැව් අබලන් වී එලදාව අඩු වී තිබුණු හෙයින් හේන් වගාව බහුලව කෙරිණ (කරුණානන්ද, 2015, 19-20). 1833 වර්ෂයේ සිට

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලකයෝ වියළි කලාපයේ කපු වගාවට ජනතාව උනන්දු කරවූහ. පසුව පාලකයින් තුළ වූ එම උනන්දුව හීන වූ අතර එක්දහස් අටසිය අසූ ගණන්වලදී කෝපි කර්මාන්තය අභාවයට ගිය විට යළි කපු වගාවට උනන්දුවක් ඇති විය (සිරිවීර, 2017, 73). හේන් ගොවිතැනේ දී ඇතැම් ප්‍රදේශවල බෝග වර්ග කිහිපයක් මිශ්‍ර කොට වගා කරනු ලැබිණි. අනෙක් ගොඩ බෝග හා මිශ්‍ර කොට බඩඉරිඟු හා ඉදල් බඩඉරිඟු නුවරකලාවියේ සෑම ගමකම පාහේ වගා කරනු ලැබිණ. මේවා තමන්කඩුවේ බහුලවම වගා කෙරිණ. ඒ ප්‍රදේශයේ ඇති ඇලූවියල් පසෙහි ඇති සරු සාරවත්භාවය නිසා මේ බෝගවල කරල් ලොකුවට මෙන්ම ඒවායේ ඇට ද සනව වැඩෙයි (තෙන්නකෝන්, 2005, 349).

එක් එක් කලාපයන්හි වගා කරන ලද භෝගයන්ට අනුව වගා කිරීමේ කාලයන් ද වෙනස් ය. වන්නියේ කැළේ කපනු ලැබුවේ අප්‍රේල්, මැයි හා ජූනි මාසවල දී වන අතර ඉතිරි වූ ගහකොළ පිළිස්සුවේ ජූලි හෝ අගෝස්තු මාසවල දී ය (Bastiampillai, 1991, 117). කුරක්කන් වැපුරුවේ සැප්තැම්බර් හා නොවැම්බර් අතර හා අස්වනු නෙලන ලද්දේ පෙබරවාරි හෝ මාර්තු ය. වරගු වවන ලද්දේ අගෝස්තු හා සැප්තැම්බර්වල දී අලුත් හේන්වල හා ඔක්තෝම්බර්වලදී අත්හරින ලද පැරණි හේන්වල යි. එල්ලු මාර්තු හෝ අප්‍රේල් මස වපුරන ලදී. එහි අස්වනු ලබාගන්නා ලද්දේ ජූනි හෝ ජූලිවල යි (එම). යල කන්නයේ දී තල වපුරනු ලබන්නේ පෙබරවාරි - මාර්තු කාලය තුළදී ය (තෙන්නකෝන්, 2005, 349).

සාම්ප්‍රදායික හේන් වගාව තුළ භෝග මාරු ක්‍රමය හෝ බිම් මාරු ක්‍රමය විශේෂ කොට දැක ගත හැකිය. බිම් මාරු ක්‍රමයේදී සිදු වන්නේ වගා කළ භූමි ප්‍රදේශය සැලකිය යුතු කාලයක් අත්හැර දැමීම මගින් පස සශ්‍රීක කිරීම යි. එකම හේන දෙතුන් අවුරුද්දක් වගා කොට එහි සාරය නැතිව ගිය විට ඒ අසල කැළයේ තවත් හේනක් කොටා ගනිති. මෙසේ කැළේ කොටස් මාරුවෙන් මාරුවට වගා කරනු ලැබේ. හේන් බිම් අවුරුදු දහයක් හෝ දොළහක් පාලුවට යන්ට හැර නැවතත් වගා කිරීමට පටන් ගනිති (විජේසේකර, 1986, 135). මේ බිම් මාරු ක්‍රමය වැද්දන් විසින් ක්‍රි.ව. 19 වන සියවසේ සිදු කරන ලද බව පාකර් සඳහන් කර ඇත. එනම් වැද්දන් විසින් එක වගාවකට හෝ සමහරවිට වගා දෙකකට පසු හේන අත්හරිනු ලබන බවත්, එවිට එය නැවතත් වනය විසින් ආක්‍රමණය කෙරෙන බවත්, අනතුරුව වසර පහක් හතක් පමණ කාලයක් ඉකුත් වනතුරු එහි නැවත වගා කරනු නොලැබෙන බවත් දක්වයි (ජයසේන, 2014, 76). බෝග මාරු කිරීමේ දී දෙවනවර වැවීම සඳහා ඕනෑම බෝගයක් තෝරා නොගන්නා අතර ඒ සඳහා සාම්ප්‍රදායික ගැමියන් තුළ අවබෝධයක් පවතී.

### වගාව ආරක්ෂා කරගැනීම

කැළෑ එළි පෙහෙළි කිරීම, වගා කිරීම මෙන්ම සිය වගාවන් වන සතුන්ගෙන් ආරක්ෂා කිරීම ද ඉතා වැදගත් කාර්යයකි. එහි දී සුවිශේෂ වන්නේ සාමූහික හැඟීමයි. සාමූහිකත්වය නිසා ගොවි කණ්ඩායම්වලට මුර ක්‍රමයට සියලුම හේන් ඉඩම් ආරක්ෂා කර ගත හැකි විය (සිරිවීර, 2017, 71). මෙම සාමූහික හැඟීම නිසා වගාවන් ආරක්ෂා කරගත හැකි වූ අතර, පැරණි විරසක ආදිය තුරන් කරමින් එක් හැඟීමකින් යුතුව මුළු ගමම එකට ඒකරාශි විය.

මේ ගොවිතැන් ක්‍රමයේ ඉතාම වෙහෙස ගෙන දෙන සුළු සේවය නම් මුර කිරීම වන අතර මේ සඳහා දඬුවැට මගින් කොටු කරන ලද හරියේ මුර පැලක් සාදති (විජේසේකර, 1986, 135-136). දඬුවැට මගින් ද හේනට යම් ආරක්ෂාවක් සැපයෙනු ලැබේ. කැළෑ එළිපෙහෙළි කර එහි පඳුරු හා කුඩා ගස් ගිනි තැබීමෙන් පසු නොදැවුණු සහ අඩක් දැවුණු ලී කොටන් හේනේ ආරක්ෂිත වැට ශක්තිමත් කිරීම සඳහා තැන්පත් කරනු ලැබේ. ඒවා දමන ලද තැන්වල පසුව 'දඬුවැට' යයි නම් කරන ලද ආරක්ෂිත වැට ඉදි කෙරෙන්නේ පැළ වැඩී ගෙන එන කාලයෙහිදී ය (සිරිවීර, 2017, 71). හේන් වගාවේ දුෂ්කරම කාර්යය අලි ඇතුන් ඌරන් මුවන් වලසුන් ආදී වන සතුන්ගෙන් හේන් වගා ආරක්ෂා කර ගැනීමයි. හේන් තුළ කළ යුතු යම් යම් කාර්යයන්ට පහසුවීම සඳහාත් ගොවි උපකරණ තැන්පත් කර තැබීම සඳහාත් හේන තුළ පැල නමින් හඳුන්වන කුඩා කුටි නිවසක් තනනු ලැබේ. මේ පැල වර්ග දෙකකි. එකක් 'බිම් පැල' වන අතර එකක් ගස් පැල් ය. බිම් පැල පොළොව මත සාදන අතර, විශාල ගස් මත ඉදිකරන පැල 'ගස් පැල' නම් වේ. පැලට නගින්නේ ගස මුල සිට පැල දක්වා බඳින ලද ඉණිමගක ආධාරයෙනි (දිසානායක, 1996, 56). හේනට එන වන සතුන්ගෙන් හා කුරුල්ලන්ගෙන් හේන රැක ගැනීමට ගොවියා විශාල වෙහෙසක් දරන්නට සිදු විය.

වගා කරන හේන්වල තනා ඇති බිම් පැල තුළ රාත්‍රී කාලයේ ගිනි ගොඩ පත්තු කිරීම නිරන්තරයෙන් දැකිය හැකි අතර පැල් රකින්නන් විසින් ගයනු ලබන කවි හා නගනු ලබන හූ හඬ ද නිරන්තරයෙන් ඇසිය හැකිය (දිසානායක, 1996, 56). පැල් රැකීම අත්‍යවශ්‍යම විය. හේන් වගාවේ සුවිශේෂ කාර්යයක් වූ පැල් රැකීම පිළිබඳ පැරණි සාහිත්‍ය ග්‍රන්ථවල ද දක්වා ඇත. හේනක පැල් රකින ලද අවස්ථාවක් පිළිබඳව අත්ථසාලිනී අටුවාවේ දක්වේ. එනම් අසාධ්‍ය ලෙස රෝගාතුර වූ තම මවට වෛද්‍ය උපදෙස් පරිදි පැල් රකිනු ලැබූ හේනකින් සය මාංශ ලබා දීම සඳහා අකුසල් කිරීමට අකමැත්තෙන් වුවද එය ඉටු කිරීමට ඉදිරිපත් වූ පුතෙකු ගැන එහි සඳහන් වේ (අත්ථසාලිනී අටුවා, 2008).

යම් පුද්ගලයෙක් හේන් ගොවිතැන් කරලූ නම් එහි වැඩ කිරීම් පහසුවනු සඳහා ඔහු සිය පවුල පිටින් ම එහි පදිංචි වෙයි (විජේසේකර, 1986, 135). බොහෝවිට කුරක්කන් වවන ගම්වැද්දන් විසින් සැතැප්මක් හෝ ඊට ඇත තැනක සිය වාසස්ථාන පිළියෙල කර ගනු ලබයි. ඒ තමන් කුරහන් වැවීමට අදහස් කරන වපසරිය කිට්ටුවෙන් විසීම සඳහා ය. කෙසේවෙතත් ඔවුන්ගේ පිරිමින් සාමාන්‍යයෙන් ගල්වැද්දන්ගේ වැනි පැල්පත් තනාගෙන මාස ගණනක් ඒවායේ ගත කරන්නේ සිය වගාව අලි ඇතුන්ගෙන් මුවන්ගෙන් හා මී හරකුන්ගෙන් ආරක්ෂා කර ගැනීම පිණිස ය (ජයසේන, 2014, 75).

හේනට එන වන සතුන් බිය ගන්වා පළවා හැරීමට අපේ ගොවීහු උපක්‍රම රාශියක් භාවිත කළහ. ඔවුන් සතුන් මරා දැමුවේ පළවා හැරීමට නොහැකි වූ විට පමණි. එවැනි රැකුම් බැලුම් විධි රාශියක් ගැමියන් අතර විය. ඉරිගු කරල් කන ගිරවුන් ඇල්ලීමට යොදන උපක්‍රමය යොත් දුනු ඇටවීම නමින් බින්තැන්නේ හඳුන්වන බව දක්වයි. ගල් දුන්නක ආකාරය ගත් ඊට මදක් කුඩා යොත් දුන්න අටවා ඉරිඟු කරල් මත බැඳ තියනු ලැබේ. ගිරවා ඉරිඟු කරල මත වසන විට යොත් දුන්න ගැස්සී ගිරවාගේ පාදය හිරකරනු ලැබේ. සාවුන්, මීමින්නන් වැනි සතුන් සඳහා මඳු ගසා බිම රඳවා තබයි. ඔවුන් එන මාර්ගයේ අටවන මන්ද මැදින් යාමට සතා උත්සහ ගන්නේ මන්දක් ඇති බව නොදැන ය. මන්දේ ගැටීම නිසා එය ගැස්සී සතා හිර කරයි. මුව, ගෝන, ඌරු, කුළු මී වැනි

සතුන් ද මදුවලට අසුකර ගැනීමට ගැමියෝ දන්න සිටියහ. සතුන් එන මංකඩවල හබක ඇටවීම ද තවත් ආරක්ෂක ක්‍රමයකි (කහඳගමගේ, 1996).

උතුරුමැද පළාතේ තල වගාවේ දී සතුන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා ගොවීන් විසින් උපක්‍රම කිහිපයක් අනුගමනය කරනු ලබයි. කොබෙයියන්ගෙන් වැපුරූ තල බේරාගැනීම සඳහා ඒවා පසට යට කරනු ලැබේ. තල පැළවී දින 8 ක් 10 ක් ගිය විට ඒ පැළ හාවුන් හා මුවන්ගෙන් ආරක්ෂා කරගත යුතුය. විශේෂයෙන්ම වැලි මුවෝ තල පැළ කෑම ප්‍රිය කරති. පැළ මෝරා යන තෙක්ම ඒවාට පණුවන්ට හානි කළ හැකිය. ගවයින් තළ කෑමත් තල හේන් වට කොට වැට බඳින්නේ නම් ගව හානි මග ඇරවීමට අපහසු නොවේ. අලි තල නොකන නිසා කුරක්කන් සහ මුං මෙන් තල ආරක්ෂා කිරීමට වෙහෙස වීමත් අනවශ්‍ය ය (තෙන්නකෝන්, 2005, 367-368).

සාම්ප්‍රදායික හේන් ගොවිතැන තුළ ඒ සඳහා ම ආවේණික වූ උපකරණ භාවිතා කරනු ලැබේ. මේවායෙහි විශේෂත්වය වන්නේ ග්‍රාම්‍ය පරිසරයේ එදිනෙදා නෙත ගැටුණු ස්වභාවික අමුද්‍රව්‍යවලින් නිර්මාණය කිරීමට ගැමියා උත්සුක වී තිබීම යි.

සල ගොවිතැන් ක්‍රමය[5] තුළ දී ශ්‍රමය කාන්තාවන්, පුරුෂයින් හා වැඩිහිටියන් ආදී වශයෙන් ගෘහස්ත සාමාජිකයින් අතර බෙදී යයි. විශේෂ කාර්යයන්හි දී ළමයින් සහභාගී කරවා ගැනේ. මෙම ක්‍රියාවලීන්හි දී ලිංගිකත්වය මත ශ්‍රමය බෙදී යාම විශේෂිත කරුණකි. පුරුෂයින් භූමිය එළිපෙහෙළි කිරීම ආදී කාර්යයන්හි දී බහුලව වගකියනු ලැබේ. කාන්තාවන් අස්වැන්න නෙළීම වැනි කාර්යයන්හි දී ප්‍රමුඛ කාර්යභාරයක් හිමි කර ගනී (Thrupp et.al, 1997, p.18).

බොහෝවිට කුරක්කන් වවන ගම්වැද්දන් විසින් සැතැප්මක් හෝ ඊට ඈත තැනක සිය වාසස්ථාන පිළියෙළ කර ගනු ලබයි. ඒ තමන් කුරහන් වැවීමට අදහස් කරන වපසරිය කිට්ටුවෙන් විසීම සඳහා ය. කෙසේවෙතත් ඔවුන්ගේ පිරිමින් සාමාන්‍යයෙන් ගල්වැද්දන්ගේ වැනි පැල්පත් තනාගෙන මාස ගණනක් ඒවායේ ගත කරන්නේ සිය වගාව අලි ඇතුන්ගෙන් මුවන්ගෙන් හා මී හරකුන්ගෙන් ආරක්ෂාකර ගැනීම පිණිස ය (ජයසේන, 2014, 75).

හේන් ගොවිතැනේ නියැළෙන ගොවීහු සිය කාර්යයන් සඳහා හේනට පිටත්වීමේ දී ජලය රැගෙන යාමට අමතක නොකළහ. සද්ධර්මාලංකාරයේ ගාමදාරිකා වස්තුවේ සඳහන් ඉඩමක එක් නියං සමයක දී උඳු නෙළීම සඳහා ජලය ද රැගෙන ගිය කතක් ගැන දැක්වෙන පුවත ඒ සඳහා නිදසුනක් ලෙස දැක්විය හැකිය. පුරුෂයින් විසින් සිදු කරනු ලබන ගොවිතැන් කටයුතුවල දී කාන්තාවන් ද ඔවුන්ට හිමිව තිබූ කාර්යභාරය මැනවින් ඉටු කරමින් සහයෝගීව කෘෂි කටයුතු සඳහා දායකත්වය ලබා දුන් බව පෙනේ (සද්ධර්මාලංකාරය, 1996, 578).

සල ගොවිතැන සඳහා ශ්‍රම සම්පාදනය නොයෙක් කලාපවල විවිධාකාරව පවතී. භූමිය එළිපෙහෙළි කිරීම හා ශ්‍රමය බහුලව අවශ්‍ය කාර්යයන් සඳහා කුලියට ගැනීම හෝ හුවමාරු ශ්‍රමය මත සිදු කර ගැනේ.

ක්‍රි.ව. 19 වන සියවසේ දී හේන් ගොවිතැනේදී ඔතු ක්‍රමය හා බැදි ඉඩම් භුක්ති ක්‍රමයක් විය. පළමු ඔතු ක්‍රමය යටතේ යම් යම් හේන්වල වපුරන ප්‍රමාණය හා සමාන

අස්වැන්නක් හෝ එමෙන් එකහමාරක් හෝ එමෙන් දෙගුණයක් හෝ අයිතිකරුවාගේ කොටස් වශයෙන් ගෙවීමේ එකඟත්වය මත ගොවියකු විසින් වගා කරන ක්‍රමයක් විය. හත් කෝරලයේ ද, සබරගමුවේ ද, හේවාහැට ද, හාරිස්පත්තුවේ සමහර හේන්වල ද, මේ ක්‍රමයට ගොවිතැන් කරනු ලැබිණ. දෙවන ඔතු ක්‍රමය යටතේ ඇල් වී වගා කරන යහපත් මට්ටමේ හේනකින් හෝ ලැබෙන අස්වැන්නෙන් තුනෙන් එකක් අයිතිකරුවාට ගෙවීමේ ක්‍රමයක් විය. තෙවන ඔතු ක්‍රමය යටතේ වෙනත් කෙනෙකු විසින් වපුරන ලද තමන්ට අයත් හේනේ පළමු අස්වැන්නෙන් විශාල පෙට්ටියකට අල්ලන අස්වනු ප්‍රමාණයක් හෝ මිනිසෙකුට උසුලා ගෙන යා හැකි මට්ටමේ බරක් සහිත අස්වනු ප්‍රමාණයක් අයිතිකරුවා විසින් කපා ගැනිණ. සියලු ම කැළෑ හා හේන් රජුට අයත් ය යි සැලකුණු හෙයින් ඔහුගේ අවසරය නොමැති ව කපා හෙළි කිරීම හෝ වගා කිරීම හෝ තහනම් විය. හේනක් කෙටීම සඳහා ඇමතිවරයෙකු මගින් රජුගේ අවසරය ලබා ගත යුතු විය (සෝමරත්න, 2005, 173-174).

මහනුවර රාජධානි සමයේ දී සබරගමුව සත්කෝරලේ මාතලේ ඌව නින්දගම් හා විහාරස්ථාන සහ සත් කෝරලේ රාජකීය ගම්මාන බොහොමයක හේන් මගින් මුදල් ලෙස හෝ බදු ලෙස (ඔතු) ගෙවීම් කළ බවට නිශ්චිත සාධක පවතී (Codrington, 1938, 45) wright විසින් දක්වන පරිදි සබරගමුව මාතර හා අනෙක් ප්‍රදේශවල මිනිසුන් විසින් කලින් කල වගා කරන ලද සැතපුම් 30 ක් දිගින් හා සැලපුම් 16 ක් පමණ පළලින් යුත්, ඌව වෙලන්විට රාජකීය හේන්වලින් බිම්-මිල අයබදු වශයෙන් ලබා ගත් බවට නිදසුන් ය (එම).

හේන් සඳහා භාවිත කරන ලද ඉඩම් සාමුහික අයිතිය තිබූ ඉඩම් හෙයින් ගම්වාසීන්ගේ එකඟතාව මත ඒ ඒ පවුල් සඳහා ඒ ඒ කන්නයන්හි දී හේන් ඉඩම් වෙන්කර දී ඇත. එහෙත් පසුව බ්‍රිතාන්‍ය පාලනය යටතේ කැළෑ පිළිබඳ නීති රීති හඳුන්වා දෙන ලද හෙයින් එම චාරිත්‍රය අහෝසි වී ගියේය (සිරිවීර, 2017, 69).

**හේන් වගාව හා බැඳි ඇදහිලි, විශ්වාස හා ජන කවි සාහිත්‍යය**

ලෝකයේ වෙනත් රටවල සල ගොවිතැන ලෙසින් හැඳින්වෙන මෙම හේන් ගොවිතැන සමග ආගමික විශ්වාස හා චාරිත්‍රාදිය ඉතා සමීපව සම්බන්ධ වී පවතී. විශේෂයෙන්ම වාර්ෂික ක්‍රියාවලියේදී විවිධ අවස්ථා එනම් භූමිය තෝරාගැනීම, එළිපෙහෙළි කිරීම, ගිණිතැබීම, පැළ සිටුවීම හා අස්වැන්න නෙළීම ආදී කාර්යයන්හි දී මෙය දකගත හැකිය (Thrupp et.al, 1997, p.7). හේන් වගාව ගැමි ජනයා විසින් සිය ද්විතීයික ආහාර අවශ්‍යතාව පූරණය කරලීම සඳහා පවත්වා ගෙන ගිය පොදු වගා ශිල්ප ක්‍රමයක් වුවත්, මෙරටෙහි එක් එක් කලාපවල ජීවත්වූවන් ඒ ඒ කලාපයන්ට අවේණික ව හේන් ගොවිතැන හා සම්බන්ධව විවිධ සංස්කෘතිකාංග පවත්වාගෙන යන බව කැපී පෙනෙන කරුණකි. ඇතැම් චාරිත්‍ර වාරිත්‍ර එකම ආකාරයෙන් සිදු වුවත්, නාමකරණයන්හි යම් යම් වෙනස්කම් පවතින බව පෙනේ. එක් එක් ප්‍රදේශයන්හි හේන් වගාව හා බැඳි ඇදහිලි, විශ්වාස හා ජන කවි සාහිත්‍යය පිළිබඳ විමසීමේ දී මේ කරුණ වඩාත් පැහැදිලි කරගත හැකිය.

එක් එක් ප්‍රදේශයන්හි පළාතට අධිපති දෙවි දේවතාවුන්ගේ ආශිර්වාදය ලබා ගනිමින් හේන් ගොවිතැනේ නියැලීමට ගැමියෝ පෙළඹී සිටියහ. බින්තැන්න, දිගාමඩුල්ල හා වැව්ගම්පත්තුවේ දී පුල්ලෙයාර් දෙවියන්ව ද, මාගම් ප්‍රදේශයේ කතරගම දෙවියන්

ද, වන්නිහත් පත්තුවේ දී අයියනායක දෙවියන් ද, කොළොන්නාව කෝරළයේ දී සමන් දෙවියන් ද අදහනු ලබයි. මීට අමතරව බින්තැන්නේ දී දඩයම් දේවතාවා, ඉඳිගොල්ලේ මුල්පොල රීරි දේවතාවා, වනගත රීරි දේවතාවා ආදීන් අදහනු ලබයි (කහඳගමගේ, 2011, 58). මෙම ප්‍රදේශයේ වැදි ජනයා බහුලව වාසය කරන බැවින් හේන් ගොවිතැනේ දී මෙම අවශේෂ දෙවිවරුන් අදහනු ලබයි. බින්තැන්න ප්‍රදේශයේ හේන් ඇල්ලීම හෙවත් හේන් ගෙවඩීමේ කාර්යය ඒ ප්‍රදේශයට ආවේණිකව සිදු කරනු ලැබුවේ මෙසේ ය. සුභ නැකතක් බලා කිරිබත් කා බුදුන් වැඳ දෙවියන්ට බාර වී හේන් ගෙවදීම සිදු කෙරේ. හේන් ගෙවදීම යනුවෙන් අදහස් කරන්නේ අලුතින් හේනක් සඳහා බිම තෝරා වැඩ ඇරඹීම යි. මෙම කාර්යය කෙරෙනුයේ ගම් ප්‍රධානියාගේ නායකත්වයෙනි. බොහෝ ගම්වල නායකත්වය ගන්නේ ගමරාළ ය. ආරච්චි, කෝරාල වැනි තිලයක් දරන්නෙකු යම් ගමක සිටියොත් හේන් ගෙවඩීමේ නායකත්වය මාරුවන්නේ ගමරාළට වැඩි ප්‍රභුත්වයකින් ඔවුන් සැලකෙන බැවිනි (කහඳගමගේ, 1996, 141). මෙම කාර්යය නුවරකලාවියේ දී වල් ඇල්ලීම යනුවෙන් ද, වාරුකන්දෙණිය ආශ්‍රිතව වල් ගෙවැඩීම ලෙස ද හඳුන්වයි.

පැරණි පරිපාලන බෙදීමට අනුව කුකුළු කෝරලය යනුවෙන් හඳුන්වනු ලැබූ ප්‍රදේශයේ හේන් වල් කොටා සකස් කර බීජ වපුරා අනතුරුව කඩවත තැබීම යනුවෙන් චාරිත්‍රයක් සිදු කරනු ලබයි. මෙහි දී ගිනි තාලම් යැයි කවි විශේෂයක් කියා සියල්ලෝම හේනෙන් පිටතට පැමිණෙති. ඉන්පසු හේන පූජනීය තත්ත්වයකට පත්වන නිසා ස්ත්‍රී පක්ෂය හේනට පය නොතබති. ලී යොදා කඩුල්ල බැඳ කඩවත තැබීම සිදු කරයි. කඩවත තැබීමේ දී ද කවි කියන අතර එහිදී හේන දෙවියන්ට හා යක්ෂයින්ට බාර දෙනු ලබන බව කියවේ (සමරවික්‍රම, 1994, 37). හේන්වල බීජ ඇට දැමීමෙන් පසු තම නිවෙස්වල කැවුම් පිසීම, කිරිබත් ඉවීම, කෙසෙල් කැන් ඉදවීම කරනු නොලැබෙන බවත්, මේ චාරිත්‍රය අද දක්වාම දෙමළ හත්පත්තුවේ දැක ගත හැකි ය (දිසානායක, 1996, 28).

හේන් ගොවීන් විසින් ගොවිපොළ දෙවියන්ට බාර කිරීමේ පූජා විධි ක්‍රමයක් බින්තැන්නේ පවතී. කන්දේ දෙවියන්, කුමාර දෙවියන්, කළුබණ්ඩාර දෙවියන්, හූනියම් දෙවියන්, වන්නිය බණ්ඩාර දෙවියන්, පුල්ලෙයාර් දෙවියන්, කුමාර දෙවියන් හා මැණික් බණ්ඩාර දෙවියන් යන හත් දෙනාගෙන් කෙනෙකුට බාර කළ යුතු බවට පිළිගැනීමක් ඇත (කහඳගමගේ, 1999, 91). මොණරාගල දිස්ත්‍රික්කයේ සුදුවතුරආර ගම්මානයෙහි වල් සතුන්ගෙන් සිදු වන විපත් හේතු කොට ඒ හා බැඳුණු හේන් වගාවට සම්බන්ධ විශ්වාසයක් විය. එනම් ලිතේ සෑම දිනයක් සඳහා ම අධිපති සතෙක් ඇත (සිංහයා, ඌරා, අලියා, කුරුල්ලා, කොටියා හා මී හරකා). හේන් වටා වැටවල් බැඳීමේ දී එදා දවසට අධිපති සතා කවුරුන්දැයි සැලකිලිමත් විය යුතු ය. නිදසුන් ලෙස, ඌරාගේ දවසට වැටක් බැන්දොත් වල් ඌරන් විසින් හේන් පාළු කරනවා ඇත. වැටක් බැඳීමට හොඳම දවස සිංහයා හෝ කොටියාගේ දවසේ සුබ මොහොතකි. මේ සතුන් අල පාළු නොකරන බවට පැරැන්නන් අතර විශ්වාසයක් විය (බේකර්, 2014, 138).

හේන් ගොවිතැනේ දී ගැයෙන **හේන් යාදින්න** යනු ගොවිතැන් සරු වීමෙන් ප්‍රකාශ කිරීම පිණිස කරනු ලබන ගායනය වන අතර, එය බෝග යාදිනිය නමින් ද හැඳින්වේ (සිංහල ශබ්ද කෝෂය, 1991, 402). පැල් ආශ්‍රිතව නිර්මාණය වූ ජනකවි පැල් කවි නම් වේ. පැලෙහි සිට වරින් වර නගන හූ හඬ හා රිද්මයානුකූලව ගායනා කරන මෙම ගායනා නිසා සතා සිව්පාවා වුවද වුවද හේනට ළංවන්නට දක්වන්නේ බියකි. එබැවින් බිය, සීතල, තනිකම, කාංසාව ආදී හැඟීම් අකාමකා ගැනීමේ අටියෙන්

පැල් කවි ගැයුව ද, මෙය පැල් රකින්නන් විසින් සිය හේන වන සතුන්ගෙන් ආරක්ෂා කරගැනීමට භාවිතා කරන ලද උපක්‍රමයක් ලෙස ද දැක්විය හැකිය. හේන් සැහැල්ල, කටුසර වරුණ පැල් කවි, කුරක්කන් කවි යන නාමයන්ගෙන් ද මෙම හේන් ආශ්‍රිතව ගැයෙන ජන කවි හැඳින්විණ (කහඳගමගේ, 1999, 150).

**සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ ඓතිහාසික අවධියේ දී කෘෂි ආර්ථික ඉතිහාසය ප්‍රධාන වශයෙන් කුඹුරු ගොවිතැන හා හේන් ගොවිතැන මත පදනම්ව පැවති බව ඓතිහාසික මූලාශ්‍ර අනුව පෙනී යයි. කුඹුරු ගොවිතැන සඳහා ප්‍රධාන ජල පරිභෝජන අවශ්‍යතාව පූරණය කරනු ලැබුවේ වාරි කර්මාන්තය නගා සිටුවීම මගිනි. රාජ්‍යයේ ප්‍රධාන ආදායම් මාධ්‍ය වූ බදු අය කරගැනීමට වැඩි වශයෙන් බදු පනවා තිබුණේ ද කුඹුරු ගොවිතැන හා වාරි කර්මාන්තය සඳහා ය. සංඛ්‍යාත්මකව හා අවකාශීය වශයෙන් ගත්කල, වර්තමානය වනවිට ශේෂිතව පවතින වාරි නිර්මාණයන් දෙස බැලීමේ දී හා කුඹුරු ගොවිතැනින් අය කරන ලද බදු පිළිබඳව ශිලාලේඛනවල සඳහන් වීමෙන් ද, කුඹුරු ගොවිතැන සඳහා පැවති රාජ්‍ය අනුග්‍රහය පැහැදිලි වේ. එමෙන්ම සාහිත්‍යමය මූලාශ්‍රවලට අනුව කුඹුරු ගොවිතැන් ක්‍රමය රාජ්‍ය අනුග්‍රහය මත මහා පරිමාණයෙන් ක්‍රියාත්මක වූ ආකාරය ද සඳහන් වේ. හේන් වගාව කුඹුරු ගොවිතැන මෙන් රාජ්‍ය අනුග්‍රහය ලත් විධිමත් හා චිරස්ථායි ආහාර නිෂ්පාදන ක්‍රමයක් නොවූණ ද, ඉතා දීර්ඝ කාලයක සිට වර්තමානය දක්වා අඛණ්ඩව සිදුකෙරෙමින් පවතී. ඓතිහාසික අවධීන්හි වරින්වර සිදු වූ දෙස් විදෙස් ආක්‍රමණ හමුවේ වැව් අමුණු විශාල වශයෙන් විනාශයට පත් වූ බවත්, වරින්වර ඇති වූ දේශපාලන අස්ථාවරත්වයන් නිසා රාජානුග්‍රහය අඛණ්ඩව නොලැබීම ද වාරි කර්මාන්තය අඩපණ වීමට ප්‍රධාන හේතුවක් වූ බවත් ඓතිහාසික මූලාශ්‍ර සඳහන් කරයි. එමෙන්ම දීර්ඝකාලීන නියඟ තත්ත්වයන් වැනි ස්වභාවික ආපදා තත්ත්වයන් තුළ ප්‍රධාන ජල මූලාශ්‍රය වූ වාරි කර්මාන්තය අඩපණ වීම ද කුඹුරු ගොවිතැනෙහි පැවැත්ම කෙරෙහි ප්‍රබලව බලපෑම කරන්නක් විය.

එවැනි පසුබිමක් තුළ විකල්ප ක්‍රමයක් ලෙස අහස් දියෙන් වගා කෙරෙන හේන් වගාව කෙරෙහි රාජ්‍යයේ හා ප්‍රජාවගේ මැදිහත්වීම නිරායාසයෙන් සිදු විය හැකිය. අක්ඛක්ඛායික බුළුකැසාගතය පැවති සමයේ මලය රට විසූ ගැමුණු කුමාරයා සිය කුණ්ඩලාභරණද්වය විකුණා ලබාගත් මුදලින් පන්සියයක් රහතන් වහන්සේලාට ඇඹුල් සහිත තණ හාලේ බතින් පිණ්ඩ දානය  පිරිනමන ලද බවට මහාවංසයේ සඳහන් වූ අවස්ථාව එහිලා නිදර්ශනයක් ලෙස දැක්විය හැකිය. 'වී' වෙනුවට විකල්ප කටුසර බෝගයක් ලෙස තණහාල් මෙකල වගා කරන ලද බව පෙනී යයි. හේන් ගොවිතැන සරල වගා ක්‍රමයක් වුවත්, ස්ථාවර ජල අවශ්‍යතාව, දීර්ඝ කාලීන වගාව නිසා පස නිස්සාර වීම ආදී තීරණාත්මක පාරිසරික සාධකයන්ට නිරන්තරයෙන් මුහුණ දීමට සිදු වේ. මෙම දුෂ්කරතාවන් හමුවේ වුවත් සහල් මූලික කරගත් ආහාර සංස්කෘතිය තුළ ද්විතීයික ආහාර හා වෙනත් අවශ්‍යතාවන් පූරණය වූයේ හේන් වගාව මගිනි. විවිධාකාර බෝග වගා කෙරුණු මහා පරිමාණ හේන් පිළිබඳ මූලාශ්‍රගත තොරතුරු එහිලා නිදසුන් ය. විවිධ පාරිසරික දුෂ්කරතාවන් මත කෙරෙන හේන් ගොවිතැන කෙරෙහි ප්‍රජා මැදිහත්වීම දිරිගන්වමින්, දීර්ඝකාලීන බදු සහන ලබා දෙමින්, අඛණ්ඩව පවත්වා ගෙනයාමට රාජ්‍ය අනුග්‍රහය දෙන ලද්දේ ඇතැම් පාලකයන්ගේ රාජ්‍යත්වය තහවුරු කරගැනීම් සඳහා බව අභිලේඛන මූලාශ්‍ර මගින් පැහැදිලි වේ.

පාරිසරික වශයෙන් කොපමණ දුෂ්කරතා මධ්‍යයේ වුවත්, හේන් ගොවිතැනෙහි නියැලුනු පිරිස් පරිසරය පිළිබඳ ව මනා අවබෝධයකින් යුතු ව සිටි අයුරු මෙම වගා ක්‍රමයේ සමස්ත ක්‍රියාවලියම විමසීමේ දී පෙනී යන කරුණකි. එමෙන්ම සෑම කාර්යයක් ම ආරම්භ කිරීමේ දී ඒ හා බැඳි විශ්වාසයන්ට අනුව පැවති ඇදහිලි අනුගමනය කෙරෙන අතර, එම ඇදහිලි විශ්වාසයන් තුළ එක් එක් ප්‍රදේශයෙන් ප්‍රදේශයට අඩු වැඩි වශයෙන් වෙනස්කම් ද පවතින බව පෙනී යයි. ඇතැම් දුෂ්කරතාවන් මඟහරවා ගත් ආකාරය හා මෙහි නියැලුණු පිරිසගේ දුක්බාලාප, හුදෙකලාභාවය ආදී සංකීර්ණ භාවමය ප්‍රකාශනයන් පිළිබඳ නිදර්ශන දක්වෙන මුඛපරම්පරාවෙන් ම පැවත එන ජන කවි සාහිත්‍යයක් මෙම වගා ශිල්පක්‍රමය හා බැඳී පැවතීම සංස්කෘතික වශයෙන් ඉස්මතු කළ යුතු වැදගත් කරුණකි. සාමූහිකත්වය, පාරිසරික තත්ත්වයන් පිළිබඳ සැලකිලිමත්භාවය, ගහකොළ හා සත්ත්වයන් සමග බැඳි පැවති අන්‍යෝන්‍ය බැඳීම් ද හේන් ගොවිතැනේදී සංස්කෘතික වශයෙන් පැවති වටිනාකම් ය.

ඓතිහාසික අවධියේ සිට මෙසේ අඛණ්ඩව පැවති කෘෂිකාර්මික වගා ක්‍රමයක් වන මෙම වගා ශිල්ප ක්‍රමයේදී එක් භූමියක් වසර කිහිපයක් වගා කොට, පස නිස්සාරණය වීම නිසා සැලකිය යුතු කාල සීමාවක් අත්හැර දැමීම සාමාන්‍ය ක්‍රමවේදය යි. නමුත් මෙම අත්හැරීම නිසාම අඛණ්ඩ සංස්කෘතික අනුපිළිවෙලක් මෙම භූ පරිභෝජන රටාව තුළ දැක ගත නොහැක. පුරාවිද්‍යාඥ මතය වන්නේ මෙවැනි කෙටිකාලීන පුරාණ සංස්කෘතික භූ දර්ශනයක් සහිත අවකාශයක් කේවල කාල හා කේවල මාධ්‍ය පදනම මත පුරාවිද්‍යාත්මක පථයක් ලෙස අර්ථ ගැන්විය හැකි බව යි. මෙවැනි පුරාණ කෙටිකාලීන සංස්කෘතික අවකාශයන් වටා පැවති හැසිරීම් පිළිබඳ අධ්‍යයනය කිරීමට පුරාවිද්‍යාත්මක සාධක ප්‍රමාණවත් නොවන බැවින් ඓතිහාසික මූලාශ්‍රයන් හා මානවවංශ විද්‍යාත්මක පර්යේෂණවලට අනුව විග්‍රහ කිරීමෙහි ප්‍රායෝගික වැදගත්කමක් පවතී. ඒ අනුව ද්විතීයික ආහාර නිෂ්පාදන ශිල්ප ක්‍රමයක් ලෙස පැවතිය ද, හේන් වගාව මගින් මිනිසා තුළ ජනිත කළ සමාජ, සංස්කෘතික හා ආර්ථික උත්තේජක හා විභවතාවන් නිසා ම එම වගා ශිල්ප ක්‍රමය දීර්ඝ කාලයක් තිස්සේ අඛණ්ඩව පැවත ඊමට හේතු වූ බව ඓතිහාසික මූලාශ්‍ර හා මානවවංශ විද්‍යාත්මක පර්යේෂණයන්ට අනුව පෙනී යයි.

## ආන්තික සටහන්

1. කුඩා ගස් කපා පිළියෙල කරගත් මෙම හේන් 'නවදැලි හේන්' නම් විය (පීරිස්, 2016, 49).

2. මෙම හේන් 'හියර හේන්' නම් විය (එම).

3. සද්ධර්මාලංකාරය ගඩලාදෙණි නම් විහාරයෙහි විසූ දේවරක්ෂිත විජයබාහු ධර්මකීර්ති නම් සංඝරාජතුමකු විසින් රචනා කරන ලද බව ග්‍රන්ථාවසානයෙහි දක්වෙන ගාථා පන්තියෙහි සඳහන් වේ (සද්ධර්මාලංකාරය, 1996, xviii).

4. චෙංහෝ විසින් 1412, 1413, 1421-1422, 1430 වර්ෂයන්හි කළ තුන්වැනි, පස්වැනි, සත්වැනි සමුද්‍රාක්‍රමණ ගමන්වලදී ඔහු සමග ගමන් කළ මාහුවාන් නම් අය මේ ගමන්වලදී ඇසූ දුටු දේ එකතු කොට 'සාගර වෙරළේ' නම් ග්‍රන්ථයක් පළ කරන ලද අතර "වී, තල මෑ ආදී ධාන්‍ය වර්ග මෙහි ඇතත් තිරිඟු නොඋපදී" යනුවෙන් එම ග්‍රන්ථයෙහි දක්වා ඇත (පොන්නම්පෙරුම, 1961, 153). ඒ අනුව 'තිරිඟු' ධාන්‍යය ක්‍රි.ව. 15 වන සියවස වනවිටත් මෙරට වගා නොකෙරුණු බව අනුමාන කළ හැකිය.

5. ශ්‍රී ලංකාවේ දී මෙය හේන් ගොවිතැන යනුවෙන් සැලකීම මනා ය.

## ආශ්‍රිත මූලාශ්‍ර


**අත්ථසාලිනී නම් වූ ධම්මසඞ්ගණිප්පකරණට්ඨ කථා.**, (2008). පරිවර්තනය: සෝමරත්න ගම්ලත් වෙලගෙදර, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

අභයවර්ධන, එච්. ඒ. පී., (1991). **ලේකම් මිටි විමර්ෂණය.** කොළඹ: ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුව.

**අභිධානප්පදීපිකා.**, (1883). වස්කඩුවේ සුභූති හිමි. ලුකර් නාම මහසයෙන රාජකීය මුද්‍රණාලය.

අමරවංශ හිමි, කොත්මලේ., (1969), **ලක්දිව සෙල්ලිපි.** කොළඹ 11: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ආරියපාල, ඇම්. බී., (2014). **මධ්‍යකාලීන ලංකා සමාජය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**ඉතා පැරණි සිංහල බණ කථා.**, (2002). අනුවාදක: පොල්වත්තේ බුද්ධදත්ත හිමි. නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

කරුණානන්ද, යූ, බී., (2005), **නුවරකලාවියේ සමාජ සම්බන්ධතා 1815-1900.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කරුණාරත්න, ඩේවිඩ්., (2000). **එදා හෙළ දිව.** කොළඹ 11: ඇම් ඩී ගුණසේන සහ සමාගම.

කහඳගමගේ, පී., (1996). **මා දුටු බින්තැන්න.** කොට්ටාව: සාර ප්‍රකාශන.

කහඳගමගේ, පී., (2011). **හේනේ විත්ති.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කහඳගමගේ, එස්., (2011). **ගොවි බස.** දෙවන මුද්‍රණය. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

**ගිරා සන්දේශය.**, (2006). සංස්. කේ.ජී. ප්‍රේමරත්න. කොළඹ 12: ප්‍රදීප ප්‍රකාශකයෝ.

ජයසේන, බී. එන් ආර්., (2014). **හෙන්රි පාකර්ගේ පුරාතන ලංකාව.** මරදාන: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

තෙන්නකෝන්, එම්. යූ., හා වර්ෂා තෙන්නකෝන්, (2005). **එදා වැව් බැඳි රාජ්ජේ හෙවත් ලංකා සිවිල් සේවයේ ආර්. ඩබ්ලිව්. අයිවර්ස්ගේ උතුරුමැද පළාත් අත්පොත 1899.** ගොතටුව: සිරි රන්ජන ප්‍රකාශන.

දිසානායක, එම්. (1997). **වන්නියේ සමාජ සංවිධානය හා නවීකරණය.** කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

පීරිස්, ආර්., (2016). **සිංහල සමාජ සංවිධානය.** පස් වන මුද්‍රණය. බොරලැස්ගමුව: සීරුස (පෞද්) විසිදුනු ප්‍රකාශකයෝ.

**පූජාවලිය,** (1986). සංස්: කිරිඇල්ලේ ඤාණවිමල හිමි. කොළඹ 11: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

පොන්නම්පෙරුම, ඩී. පී., (1961). **විදේශීන් දුටු පුරාණ ලංකාව.** මහනුවර: ආර්ය මුද්‍රණාලය.

**බුත්සරණ,** (2002). විද්‍යා චක්‍රවර්තී. දෙවන මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බේකර්, ඩබ්. ජේ., (2014). **සුදුවතුර ආර ගම:** සිංහල ගමක ජන ජීවිතය. පරිවර්තනය: සමරසිංහ ගුණසේකර. නුගේගොඩ: සුනෙර ප්‍රකාශකයෝ.

**මහාවංසය** (ප්‍රථම භාගය), (1967). සංස්. ශ්‍රී සුමංගල නායක මාහිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා. කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

**රසවාහිනී,** (1987). සම්පාදක: රංජිත් වනරත්න.

ලීච්, ඊ. ආර්., (2016). **පුල් එළිය.** අනුවාදය: එම්.ඩී.එච්. සෙනෙවිරත්න. කොළඹ 10: සූරිය ප්‍රකාශකයෝ.

විජේසේකර, එන්., (1986). **ලංකා ජනතාව.** කොළඹ 11: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

වෙත්තමුනි, ඩබ්., (2008). **මහාවංසය හා සිංහල ජන ජීවිතය.** කර්තෘ ප්‍රකාශනයකි.

**සද්ධර්මරත්නාවලිය**, (2007). කිරිඇල්ලේ ඥාණවිමල හිමි. කොළඹ 11: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

**සද්ධර්මාලංකාරය.**, (1996). සංස්: ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම. බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

**සමන්තපාසාදිකා විනයට්ඨකථා.**, (2009). පරිවර්තනය: අම්බලන්ගොඩ ධම්මකුසල හිමි. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සමරවික්‍රම, සී., (1994). **කුකුළු කෝරළයේ ජනකවි හා ගැමි සංස්කෘතික ලක්ෂණ.** පන්නිපිටිය: තිලක් ප්‍රින්ටර්ස්.

**සිංහල ශබ්ද කෝෂය.**, (1991). 26 වන කාණ්ඩය, 46 වන භාගය. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

**සිඛවළඳ හා සිඛවළඳවිනිස.**, (2008). සංස්. වී. ඩී. එස්. ගුණවර්ධන. කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සිරිවීර, අයි., (2017). **ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික තාක්ෂණය සහ වෘත්තීය භාවිතය.** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

සෝමදේව, ආර්., (2006), පථය, පරිශ්‍රය හා ජනාවාසය: පුරාවිද්‍යාත්මක ස්ථාන හඳුනාගැනීම හා අර්ථ දැක්වීම් පිළිබඳ ගැටළු කිහිපයක්. **සරසවි සඟරාව.** සිව්වන කලාපය. පුරාවිද්‍යා අධ්‍යයනාංශය. කැළණිය විශ්වවිද්‍යාලය.

සෝමරත්න, එච්. ඇම් ඇල්ලේපොළ., (2005). **ඩේව් දුටු ලංකාව.** තුන්වන මුද්‍රණය. බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

Bastiampillai, B. E. S. J., (1991). Agricuture in the Vanni in Nothern Ceylon (Sri Lanka) during the Early 19th Century in **Vidyodaya Journal of Social Sciences**. Vol. 5. University of Sri Jayawardhanapura.

Codrington, H, W., (1938). **Ancient Land Tenure and Revenue in Ceylon**. Colombo, Government Press.

**EPIGRAPHIA ZEYLANICA** Vol II., (1928) (ed.) Don Martino De Zilva Wickramasinghe. London( Oxford University press.

**EPIGRAPHIA ZEYLANICA** Vol III., (1933). (ed.) Don Martino De Zilva Wickramasinghe. London( Oxford University press.

**EPIGRAPHIA ZEYLANICA** Vol IV., (1943). (ed.) Senarath Paranavitana and H.W. Codrington. London( Oxford University press.

Thrupp L. A., Susanna Hecht and John Browder, 1997. http://pdf.wri.org/diversitydynamicscultivation_bw.pdf 2021.10.03

Manathunga, A., 2006. Cereal Cultivation in Hortain plains: prehistoric or later historic? in **Retrospect**, University of Kelaniya.